## කාර්ය පත්‍රිකාව

**නිපුණතාව 2.0** **නාට්‍ය හා රංග කලාව විෂය පිළිබඳ න්‍යායාත්මක පදනම ප්‍රගුණ කරයි.**

**නිපුණතා මට්ටම 2.2** **නාට්‍ය කලාව හා සම්බන්ධ පාරිභාෂිත වචන අර්ථ නිරූපණය කරයි.**

- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. රංග භූමිය හා සම්බන්ධ සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.
    i. රංග පීඨය , රඟ මඬල , කරලිය , වේදිකාව යන නම්වලින් හඳුන්වයි.
    ii. වෘත්තාකාර ස්වරූපයෙන්ම පිහිටා ඇත.
    iii. තැනිතලා භූමියක නිර්මාණය වීම.
    iv. ප්‍රේක්ෂකාගාරයක් ඇත.
    v. නේපත්‍යාගාරයක් පිහිටා තිබේ.

02. වේෂභූෂණ හා අංගරචනය පිළිබඳ පහත ප්‍රකාශයන්ගෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
    i. වේෂභූෂණ හා අංගරචනා නිර්මාණ රූපලාවන්‍ය ශිල්පියෙකු සතු කාර්යයකි.
    ii. මෙම කලාවන් දෙක මඟින් රූපණ ශිල්පියාගේ අභ්‍යන්තර සමාරෝපය ගොඩ නැගීමට උපකාරී වේ.
    iii. නාට්‍යයේ තේමාව හා ශෛලිය හා චරිත ස්භාවය පිළිබඳව සැලකිලිමත්ව මෙම කලාවන් දෙක යොදාගත යුතුය.
    iv. වේෂභූෂණ හා අංග රචන ක්‍රියාවලිය නාට්‍ය අධ්‍යක්ෂක විසින් සිදුකරනු ලබයි.
    v. මෙම කලාවන් දෙක අනෙකුත් ආනුශංගික කලාවන්ට වඩා ඉස්මතු වන ලෙස යොදාගත යුතුය.

03. රංග භූමි අලංකරණය හා සම්බන්ධ නොගැළපෙන වැකිය තෝරන්න.
    i. රංගභූමිය අලංකාර ලෙස සැකසුමයි.
    ii. ජවනිකාවේ පසුබිම නිරූපණය කරයි.
    iii. වේදිකා පසුතල නිර්මාණයයි.
    iv. ආනුෂංගික කලාවන්ට අයත්ය.
    v. ප්‍රේක්ෂාව ගොඩනැගීමට උපකාරී වේ.

04. “රංග වින්‍යාසය” සම්බන්ධ වඩාත් ගැලපෙන පිළිතුර වන්නේ ,
    i. රංගනය තුළින් චමත්කාරය ලබාදීමයි.
    ii. ශෛලගත ලෙස රංගනය සිදුකිරීම.
    iii. රංගනයට අදාල චලන හා රිද්ම මනාව පෙළගැස්වීම.
    iv. ගායනය හා වාදනය රංගනයට එකතු කිරීම.
    v. රංගනය තාත්වික ලෙස කිරීම.

05. රංග භූමි පාලන සතු කාර්යය සම්බන්ධ සාවද්‍ය ප්‍රකාශය වන්නේ ,
    i. රංග භූමියේ සියලු කටයුතු භාරව සිටින පුද්ගලයාය.
    ii. වේදිකා පාලක ලෙස හඳුන්වයි.
    iii. නාට්‍ය වේදිකාගත කිරීමේදී දර්ශනවාර සංවිධානය කරයි.
    iv. රූපණ ශිල්පීන්ගේ පෞද්ගලික ගැටළු විසඳයි.
    v. නාට්‍ය නිෂ්පාදනයට සම්බන්ධ සියළු දෙනා මෙහෙයවයි.

- **කෙටි පිළිතුරු සපයන්න.**

06. නූතන ප්‍රොසිනියම් වේදිකාවේ භූගෝලීය බෙදීම ඇඳ නම් කරන්න.
07. නාට්‍ය අධ්‍යක්ෂ සතුව ගුණාංග ලියා දක්වන්න.
08. රූපණ කාර්යය සාර්ථක කරගැනීමට උපකාරීවන කලාවන් 04 ක් නම් කරන්න.
09. ප්‍රේක්ෂාව යනු කුමක්ද ?
10. රංගභූමි අලංකරණය හා නාට්‍යෝපකරණ යනු මොනවාද ?

- **රචනා ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

11. නාට්‍ය අධ්‍යක්ෂක , අර්ථපති , රංගභූමි පාලන සතු කාර්යය පැහැදිලි කරන්න.
12. නාට්‍ය නිර්මාණය සඳහා රංග වින්‍යාසයෙහි ඇති වැදගත්කම පැහැදිලි කරන්න.
13. නාට්‍යයේ ප්‍රේක්ෂාව මැවීම සඳහා දායකවන අංගයන් දක්වමින් එහි දායකත්වය පිළිබඳ විග්‍රහයක යෙදෙන්න.
14. “රංග භූමි තාක්ෂණය” නාට්‍යයේ ගුණාත්මක වර්ධනයට දායක වන ආකාරය ඔබ නරඹා ඇති නාට්‍යයක් ඇසුරෙන් විමර්ශනය කරන්න.